සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

තෙවන වාර පරීක්ෂණය 2020 | 11 ශ්‍රේණිය
மூன்றாம் தவணைப் பரீட்சை 2020 | தரம் 11
**Third Term Test 2020** | **Grade 11**

කෘෂි හා ආහාර තාක්ෂණය I | පැය එකයි
விவசாய மற்றும் உணவுத்தொழினுட்பவியல் I | ஒரு மணித்தியாலம்
**Agri & Food Technology I** | *One hour*

(01) පුරාණ වැව් පද්ධතියේ ස්වාභාවික ප්‍රදේශ එකිනෙකට විද්‍යාත්මකව සම්බන්ධව පවතී. මෙය හඳුන්වනු ලබන්නේ,

i) එල්ලංගා පද්ධතිය ලෙසය
ii) වැව් ඉස්මත්ත ලෙසය
iii) පෝෂක ප්‍රදේශය ලෙසය
iv) පෝෂිත ප්‍රදේශය ලෙසය

(02) බෝග වගාව කෙරෙහි දේශගුණික සාධකවල බලපෑම පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.

A - අලබෝග වල අඛණ්ඩ වර්ධනය හා දිවා කාලයේ වැඩි උෂ්ණත්වයක් හා රාත්‍රී කාලයේ අඩු උෂ්ණත්වයක් තිබීම හිතකරය.

B - කැරට් හා බීට් වල පුෂ්ප පිපීම සිදුවන්නේ එම ශාක අඩු උෂ්ණත්වයක පැළ වූ විටය.

C - දඩු කැබලි මුල් ඇද්ද වීමට සාපේක්ෂ ආර්ද්‍රතාවය වැඩිවීම හිතකරය.

මෙම ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

i) A පමණි  ii) A හා B පමණි  iii) A හා C පමණි  iv) A, B,හා C සියල්ලම

(03) පසක් ජලයෙන් සංතෘප්ත අවස්ථාවේ සිට ක්ෂේත්‍ර ධාරිතාවට පත් වීමේදී පසෙන් ඉවත් වන ජල ආකාරය වන්නේ,

i) ජලාකර්ශණ ජලය
ii) කේශාකර්ශණ ජලය
iii) නිදහස් ජලය
iv) ගුරුත්වාකර්ශණ ජලය

(04) වැවක සොරොව්වෙන් පිටවන ජලයේ පීඩනය අඩු කිරීම සඳහා සකස් කර ඇති ව්‍යුහය,

i) සලපනාව
ii) බිසෝකොටුව
iii) වාන් දොරටුව
iv) වැව් බැම්ම

(05) සිසුන් පිරිසක් විසින් පාසල් වත්තේ වර්ෂාපතනයක් ස්ථාපිත කරන ලද අතර ගුරුතුමා විසින් එහි දෝෂයක් පෙන්වා දෙන ලදී. එම දෝෂය විය හැක්කේ එම වර්ෂාපතනය,

i) එලිමහන් ස්ථානයක පිහිටුවීමය
ii) ආසන්නව ගොඩනැගිල්ලේ උසට සමාන දුරකින් පිහිටුවා තිබීමය
iii) බිම සිට සෙන්ටිමීටර 30 ක් උසින් පුනිලකට සිටින සේ පිහිටුවා තිබීමය
iv) තෘණ කපන ලද සමතලා බිමක පිහිටුවා තිබීමය

(06) නිර්මාංශ ආහාර අනුභව කරන්නෙකුට ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරා ලීම සඳහා ගතහැකි ආහාර කාණ්ඩයකි,

i) කැරට්, බෝංචි, බතල
ii) වට්ටක්කා, අර්තාපල්, බඩඉරිඟු
iii) පරිප්පු, මුංඇට, සෝයා
iv) තල, පරිප්පු, බඩඉරිඟු

(07) වර්ධනය බාල වී පත්‍ර කහ පැහැවී තිබුණු නිවිති ශාකයක් ගලවා බැලූ විට එහි මූල පද්ධතියේ ගැටිති රාශියක් ඇති බව  දක්නට ලැබුනි. මෙම තත්වයට හේතුව විය හැක්කේ,

i) ශාකය වටපණු ආසාදනයට ලක් වී ඇති බවය
ii) මුල් වලට නයිට්‍රජන් තිරකරන බැක්ටීරියා ඇතුළු වීමය
iii) ශාකය පොස්පරස් ඌනතාවයකට ලක් වී තිබීමය
iv) ශාකයට දිලීර ආසාදනයක්  වී තිබීමය

(08) පැපොල් අස්වැන්න නෙලීමට වඩාත් සුදුසු අවස්ථාව වන්නේ,

i) ඵලය සම්පූර්ණයෙන්ම කොළපාට අවස්ථාවේදීය
ii) ඵලය 80% පමණ කහපාට වූ අවස්ථාවේදීය
iii) ඵලය කොල පැහැය සිට කහ පැහැයට හැරෙන අවස්ථාවේදීය
iv) ඵලය සම්පූර්ණයෙන්ම කහ පැහැයට හැරුණු අවස්ථාවේදීය

(09) ගෙවත්තේ සිටුවනු ලැබූ කරවිල ශාකයක පත්‍ර වල තැනින් තැන සිදුරු වන සේ හානි කර තිබූ අතර කුඩා කෘමි විශේෂයක් පත්‍ර මත වසා සිටිනු දක්නට ලැබුනි. මෙසේ ශාකය මත වසා සිටි කෘමි පළිබෝධකයා විය හැක්කේ,

i) ඉල්මැස්සාය
ii) එපිලැක්නා ය
iii) ගොයම් මැස්සාය
iv) අවුලකපෝරාය

(10) ඒකීය සූර්ය ප්‍රචාරකයක් මගින් දඹු කැබලි මුල් අද්දවා ගැනීම පිළිබඳව ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.

A රෝපණ මාධ්‍ය ලෙස වැලි : කොම්පෝස්ට් : මතුපිට පස් 1:1:1 අනුපාතයට යොදා ගැනීම සුදුසුය.

B දඹු කැබැල්ල සිටුවීමට ගන්නා බඳුනේ පතුල ජලවහන සිදුරු සෑදිය යුතුය.

C ඒකීය සූරය ප්‍රචාරක සඳහා පොලිතින් බඳුනේ උසින් 3/4 පමණ රෝපණ මාධ්‍ය පිරවිය යුතුය.

ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශ වන්නේ

i) A හා C පමණි
ii) A පමණි
iii) B පමණි
iv) A,B,C සියල්ලම

(11) ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය තුලදී මුළුමනින්ම ඉවත් වන ක්ෂුද්‍ර පෝෂක වෙනුවට අලුතින් එම පෝෂක එක් කර නැවත පෙර  තිබූ තත්වයට පත් කිරීම හඳුන්වන්නේ,

i) සරු කිරීම ලෙසය
ii) ප්‍රබල කිරීම ලෙසය
iii) අවම කිරීම ලෙසය
iv) පැසවීම

(12) අතුරු බෝග වගාව ලෙස හැඳින්වෙන බෝග රටාවේදී,

i) ක්ෂේත්‍රයක බෝග වර්ග 2 ක් මාරුවෙන් මාරුවට වගා කරයි

ii) ක්ෂේත්‍රයක එක් බෝගයක් දීර්ඝ කාලීනව වගා කරයි

iii) ප්‍රධාන බෝගයක් වගා කර එම බෝගයට අතරින් වෙනත් බෝගයක් හෝ බෝග වර්ග කීපයක් වගා කරයි

iv) එක් බෝගයක් වගා කර එහි අස්වැන්න නෙලීමට ආසන්න වන විට තවත් බෝගයක් ස්ථාපනය කරයි

(13) පරිණත අවධියට පසුව අස්වැන්න නෙලීම නිසා අස්වැන්නේ තන්තුමය ස්වභාවය අඩු වීම සහ වැඩි වීම පෙන්නුම් කරන බෝග වර්ග පිළිවෙලින්,

i) ලීක්ස්, මුරුංගා

ii) කැරට්, වැටකොළු

iii) බණ්ඩක්කා, මෑ

iv) තක්කාලි, බෝංචි

(14) ප්‍රෝටීන් යනු මානව පෝෂණයේදී වැදගත් වන පෝෂණ සංඝටකයකි. විටමින් පිළිබඳව වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

A – විටමින් යනු අකාබනික සංයෝගයකි.

B - විටමින් B හා C ජලයේ අද්‍රාව්‍ය විටමින් වර්ග වේ.

C - විටමින් K රුධිරය කැටි ගැසීමට වැදගත් වේ.

i) A හා B

ii) A හා C

iii) B හා C

iv) A,B හා C යන සියල්ලම

(15)

| A | B | C |
|---|---|---|
| සුදු පැහැතිය.<br>ගෝලාකාර කැට වේ.<br>ජලයේ හොඳින් දිය වේ. | ලා අළු පැහැතිය.<br>ගෝලාකාර කැට වේ.<br>ජලයේ මදක් දිය වේ. | රතු දුඹුරු පැහැතිය.<br>කුඩා ස්ඵටික වේ.<br>ජලයේ හොඳින් දිය වේ. |

A,B,C යනු සෘජු පොහොර වර්ග තුනක භෞතික ලක්ෂණ කීපයකි. මෙම ලක්ෂණ අනුව A,B,C පොහොර වර්ග තුන පිලිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ,

i) යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පෙට්, මියුරේට් ඔෆ් පොටෑෂ්

ii) යූරියා, මියුරේට් ඔෆ් පොටෑෂ් , ත්‍රිත්ව සුපර් පොස්පේට්

iii) මියුරේට් ඔෆ් පොටෑෂ් , යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පේට්

iv) ත්‍රිත්ව සුපර් පොස්පේට්, මියුරේට් ඔෆ් පොටෑෂ්, යූරියා

(16) කෘෂිකර්මයේදී ඇල්බට් ද්‍රාවණය භාවිතා කරනුයේ,

i) කෘමි පාලනයට
ii) පත්‍ර කැබලි මුල් ඇද්දවීමට
iii) පාංශු ආම්ලිකතාව උදාසීන කිරීමට
iv) ශාක පෝෂක මාධ්‍යක් ලෙස

(17) බීජ ප්‍රතිකාර කිරීමේ අරමුණක් **නොවන්නේ** මින් කුමක්ද?

i) බොල් බීජ ඉවත් කිරීම
ii) ප්‍රවේනික පාරිශුද්ධතාවය සෙවීම
iii) කෘමි හානි වැලැක්වීම
iv) වැපිරීම පහසු කිරීම

(18) ජම්බු ශාකයක ඉහළින් ඇති අත්තක් මුල් අද්දවා ගැනීමට යොදා ගත හැකි අතු බැඳීමේ ක්‍රමයකි,

i) සරල අතු බැඳීම
ii) සංයුක්ත අතු බැඳීම
iii) වායව අතු බැඳීම
iv) ගොඩැලි අතු බැඳීම

(19) ආහාර නරක්වීම කෙරෙහි බලපාන රසායනික හා මානව ක්‍රියාවක් වන්නේ,

i) එන්සයිම ක්‍රියාකාරිත්වය හා ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියා
ii) තෙතමනය හා ක්ෂුද්‍ර ජීවින්ගේ ක්‍රියා
iii) ආලෝකය හා මහා ජීවින්ගේ ක්‍රියා
iv) පීඩනය හා ආලෝකය

(20) ආහාර පරිරක්ෂණයේදී විසිරි වියලීම ක්‍රියාවලිය භාවිතා වන්නේ,

i) උකු කිරි නිෂ්පාදනයේදී
ii) පිටි කිරි නිෂ්පාදනයේදී
iii) තල් කිරි නිෂ්පාදනයේදී
iv) කිරි ජීවාණුහරණය කිරීමේදී

(21) ශ්‍රී ලංකාවේ දෙමුහුම් අභිජනනයෙන් නිපදවා ඇති වී ප්‍රභේද නම් කිරීමේදී වී ප්‍රභේදයේ වයසද සැලකිල්ලට ගෙන ඇති BW 351 වී ප්‍රභේදය වයස මාස,

i) 3
ii) 3 1/2
iii) 4
iv) 4 1/2

(22) පාලිත තත්ව යටතේ බෝග වගාවේදී යොදාගන්නා ස්ථිර ආරක්ෂිත වගා ව්‍යුහයකි,

i) පාත්ති ආවරණ
ii) පේලි ආවරණ
iii) සරල සූර්ය ප්‍රචාරක
iv) දැල් ගෘහ

(23) කුඤ්ඤ බද්ධයක් සිදු කිරීමෙන් පසු අනුජය පොලිතින් කවරයකින් ආවරණය කරන්නේ,

i) කෘමි හානි පාලනය සඳහා
ii) රෝග පාලනය සඳහා
iii) උත්ස්වේදනය පාලනය සඳහා
iv) සුළඟින් වන හානි වැලැක්වීම සඳහා

(24) කෘමි පළිබෝධ පාලනයේදී වැදගත් වන ස්වාභාවික සතුරන් පමණක් අන්තර්ගත වරණය කුමක්ද?

i) බත්කූරා, දිමියා, පිටි මකුණා
ii) පැලමැක්කා, වන්දා, මකුළුවා
iii) දිමියා,මකුළුවා, වන්දා
iv) ලේඩිබර්ඩ්, සුදුමැස්සා, කුඩිත්තා

(25) වී බෝගය වගා බිමේ සංස්ථාපනය කිරීමේ ක්‍රමවේදයක් නොවන්නේ,

i) බීජ අහඹු ලෙස විසුරුවා හැරීම

ii) බීජ පැළ සිටුවීම හා විසුරුවා හැරීම

iii) බීජ වප්කරයෙන් පේළියට සිටුවීම

iv) අතින් බීජ පේළිවලට දැමීම

(26) වගා බිමේ වල් පැළෑටි මතුවීමට පෙර ඒවායේ බීජ විනාශ කිරීමට යොදන වල්නාශක කාණ්ඩය හඳුන්වන්නේ,

i) පූර්ව නිර්ගමන වල්නාශක ලෙසය

ii) පශ්චාත් නිර්ගමන වල්නාශක ලෙසය

iii) සියල්ල නසන වල්නාශක ලෙසය

iv) ස්පර්ශ වල්නාශක ලෙසය

(27) මිරිස්, බටු, තක්කාලි වැනි බෝග වලට වැළඳෙන බැක්ටීරියා වර්ගයකි,

i) දිය මලං කෑම

ii) පිටිපුස් රෝගය

iii) හිටුමැරීම

iv) ඇන්ත්‍රැක්නෝස් රෝගය

(28) අර්ධ රූපාන්තරණයක් ඇති සතෙකි,

i) ගොයම් මකුණා

ii) එපිලැක්නා

iii) පලතුරු මැස්සා

iv) ඉල්මැස්සා

(29) තවාන් පාත්තියකට කැප්ටාන් කුඩු මිශ්‍ර කිරීමේ අරමුණකි,

i) කෘමිහානි පාලනය

ii) දිලීර රෝග වර්ධනය

iii) වල් පැල පාලනය

iv) ක්ෂුද්‍රපෝෂක ලබාදීම

(30) ඇස් වල බිටෝලප ඇතිවන්නේ කුමන විටමිනයක් ඌන වීමෙන්ද?

i) විටමින් A

ii) විටමින් B

iii) විටමින් C

iv) විටමින් D

(31) ලෝහමය ඇසුරුම් ද්‍රව්‍ය සඳහා භාවිතා වන මූල ද්‍රව්‍යකි,

i) ටින්

ii) ටින් හා ඇලුමිනියම්

iii) ඇලුමිනියම්

iv) අයන්

(32) ශාකවලට පහසුවෙන් හා ඉතා ක්‍රමවත්ව (සූක්ෂම) ලෙස ජලය සපයන ක්‍රමයකි.

i) බිංදු ජල සම්පාදනය

ii) විසිරි ජල සම්පාදනය

iii) බේසම් ජල සම්පාදනය

iv) ඇළි ජල සම්පාදනය

(33) ආහාර පරිරක්ෂණ ක්‍රමයක් <u>නොවන්නේ,</u>

i) පැසවීම ii) සාන්ද්‍රීකරණය

iii) පැස්චරීකරණය iv) හුමාලයෙන් තැම්බීම

(34) පලතුරු ඉදීමේ ක්‍රියාවලියේදී කාබෝහයිඩ්‍රේට්

i) ග්ලූකෝස් බවට පත්වේ ii) ෆෲක්ටෝස් බවට පත්වේ

iii) මෝල්ටෝස් බවට පත්වේ iv) ලැක්ටෝස් බවට පත්වේ

(35) ශ්‍රී ලංකාව තුල පසු අස්වනු හානිය ප්‍රබලව දැකිය හැක්කේ,

i) අස්වනු නෙලීමේදී ii) අස්වනු ඇසිරීමේදී

iii) අස්වනු ප්‍රවාහනයේදී iv) අස්වනු අලෙවියේදී

(36) කඩින් කඩ බෝග වගාවේදී,

i) බෝග වර්ග කීපයක් එකවිට වගා කරයි

ii) අස්වනු නෙලීමට පෙර තවත් බෝගයක් ස්ථාපනය කරයි

iii) ප්‍රධාන බෝගයට අමතරව තවත් බෝගයක් වගා කරයි

iv) කන්නයෙන් කන්නයට මාරු කරමින් බෝග වගා කරයි

(37) කඩා හැළුණු පිහාටු, ශ්වසන අපහසුතා, විශාල ප්‍රමාණයක් එකවර මිය යාම මෙම රෝග ලක්ෂණ දැකිය හැකි වන්නේ කුමන කුකුල් රෝගයක් ආශ්‍රිතවද?

i) පණු රෝග ii) පුල්ලෝරම්

iii) කොක්සිඩියෝසිස් iv) රැනිකට්

(38) යුරෝපීය ගව වර්ගවල දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

i) සාපේක්ෂ විශාල ශරීරය හා මනාව වර්ධනය වූ මොල්ලිය

ii) වැඩි කිරි නිෂ්පාදන හා ස්වේද ග්‍රන්ථි ප්‍රමාණය අඩු වීම

iii) වැඩි කිරි නිෂ්පාදනය හා දිගු ලෝම පිහිටීම

iv) ඇඟට තද වූ සම හා පිටුපස රවුම් ශරීරය

(39) ශ්‍රී ලංකාවේ කිරි අවශ්‍යතාවය ලීටර් දස ලක්ෂ 784 පමණ වේ. නමුත් ශ්‍රී ලංකාව තුළ වාර්ෂික දළ නිෂ්පාදනය වන්නේ සාපේක්ෂව ඊට අඩු ප්‍රමාණයකි. දළ වශයෙන් එම ප්‍රමාණය ලීටර් දස ලක්ෂ,

i) 290 පමණ වේ ii) 500 පමණ වේ

iii) 382 පමණ වේ iv) 210 පමණ වේ

(40) කුකුළන් ඇති කිරීමේ සියුම් ක්‍රමයෙහි ඝන ආස්ථරන ක්‍රමයේදී,

i) මූලික වියදම අඩුය

ii) රෝග පැතිරීමේ ප්‍රවණතාවය අඩුය

iii) ආහාර සඳහා සතුන් අතර තරඟය අඩුය

iv) විලෝපිකයන්ගෙන් සිදුවන හානිය අඩුය